www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද-තලිබාන් සාකච්ඡා පිටුපස ඇත්තේ කුමක් ද?

## What is behind US-Taliban talks?

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය -**
**2008 ඔක්තෝබර් 29**

ඇෆ්ගනිස්ථානයේ තලිබාන් නායකයන් සමග සෘජු සාකච්ඡා ඇරඹීමේ එක්සත් ජනපද සැලසුම් පිලිබඳව ඊයේ වෝල් ස්ට්‍රීට් ජර්නලය වාර්තා කලාය. ජර්නලය මූල්‍ය අංශයට නැඹුරු සංස්ථිතික පුවත් පතක් ය යන කාරනය සැලකිල්ලට ගත් කල්හි, මෙම තොරතුරු අනාවරනය කිරීම පත්‍ර කලාවේදයට හුරු දෙයක් නොව එක්සත් ජනපදයේ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි මාරුවක් පිලිබඳ හොඳින් හිතා මතා කල ප්‍රකාශනයකි.

.ජර්නලයට අනුව, ''මාස කිහිපයකට පෙර නම් සිතීමට වත් නොහැකිව තිබුනු, එක් කලෙකදී ඇෆ්ගනිස්ථානය පාලනය කල හා අල් කයිඩාවට රැකවරනය සැලසූ සන්නද්ධ ඉස්ලාමීය කන්ඩායමක් වන තලිබාන්හි සමහර කොටස් සමග එක්සත් ජනපදය, මුහුනට මුහුන ලා සාකච්ඡා පැවැත්වීමට සලකා බලමින් සිටීමෙන් සලකුනු කරන්නේ ප්‍රධාන ප්‍රතිපත්ති මාරුවකි. ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද මූලෝපාය පිලිබඳව ධවල මන්දිර අනුමැතිය සහිත වර්ග කල කෙටුම්පතක් '' තුල එවන් සාකච්ඡා අන්තර්ගත වන බව එය වාර්තා කරයි.

.මෙවන් සැලසුම් වලින් ඇෆ්ගනිස්ථානය තුල බරපතල ලෙස පිරිහෙමින් ඇති එක්සත් ජනපදයේ තත්වයට විසඳුම් සෙවීමට උත්සාහ දැරෙයි. රට පුරා පැතිරයන ප්‍රචන්ඩත්වය අසල් වැසි පකිස්ථානයේ ගෝත්‍රික ප්‍රදේශ කරා ද ව්‍යාප්තව ඇත. එක්සත් ජනපදයේ පිටුබලය ලබන එරට ආන්ඩුව, තලිබාන් වරුනට එරෙහිව එක්සත් ජනපදය පකිස්ථානය තුලටම කරන කඩාවැදීම් හා ගුවන් ප්‍රහාරවලට එකඟතාවය පලකිරීම මගින් අපකීර්තියට පත්ව ඇත. තලෙබාන් වරුනට එරෙහි එක්සත් ජනපද යුද්ධය මගින්, සවුදියේ ඉස්ලාම් පූජක සංස්ථාපිතය හා පකිස්ථානයේ බලගතු අයිඑස්අයි නම් මිලිටරි රහස් ඔත්තු සේවය වැනි, 1990 ගනන් මැද භාගයේ එක්සත් ජනපදයේ රහසිගත දේශපාලනික අවශ්‍යතාවන් සඳහා තලෙබාන් සන්නද්ධ භට කන්ඩායම් සංවිධානය කිරීමේදී ඊට සහායවූ වැදගත් මිතුරන් සතුරු කර ගෙන තිබේ.

තලෙබාන්වරු රාක්ෂයන් ලෙස පින්තාරු කල එක්සත් ජනපදයේ ''ත්‍රස්තයට එරෙහි යුද්ධයේ'' කයිවාරුව තිබියදීම, එක්සත් ජනපද-තලෙබාන් කථා බහ අලුත් දෙයක් නොවේ. වසර 2001 එක්සත් ජනපද ඇෆ්ගන් ආක්‍රමනයේදී එක්සත් ජනපදය යොදා ගත්තේ සාපේක්ෂව කුඩා හමුදාවකි. රට තුල එක්සත් ජනපද වාඩිලෑම රඳා පැවතුනේ ඇෆ්ගනිස්ථානයේ බෙදී ගිය ගොත්‍රික ප්‍රභූ කොටස් අත යට තබා ගැනීම මතය. ''අප සහ ඇෆ්ගන්වරු ගෝත්‍රිකයන් සමග දිනපතාම පාහේ දිස්ත්‍රික්ක මට්ටමින් සාකච්ඡා කරන්නෙමු. සමහර විට ඔවුන් තලෙබාන් වරුම හෝ ඔවුන්ගේ ආධාර කරුවන්ය. ඔවුන් නිතරම කියන්නේ 'අපට අවශ්‍ය දේ ලැබෙනවා නම් අප ආයුධ බිම තබන බවයි.' යනුවෙන් රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධරයෙක් ජර්නලයට පැවසීය.

.''මෑත සති වල සවුදි අරාබියේදී'' තලෙබාන් නියෝජිතයන් සමග එක්සත් ජනපදයේ අතයට ඇති ඇෆ්ගන් තන්ත්‍රයේ නිලධාරීන් සාකච්ඡාවල නිරතවූ බව ද එය වාර්තා කලාය.

.කෙසේ වුව ද, තලෙබාන්වරු සමග සාකච්ඡා සඳහා ඇති සීමාවන් මගින්, ක්‍රියාත්මක කල හැකි ඇෆ්ගන් ප්‍රතිපත්තියක් සැලසුම් කිරීමේදී එකසත් ජනපද නිලධාරීන්ගේ කටයුතු සිරවී තිබේ. ''සමහර එක්සත් ජනපද නිලධාරින් තලිබාන් නායකයන් සමග හෙමින් සීරුවේ නිල නොවන සම්බන්ධකම් පවත්වන නමුත් මිලිටරිය වඩාත් ඇලුම් කරන්නේ ඔවුන් අත් අඩංගුවට ගැනීමට'' බව එක් ඔත්තු සේවා නිලධාරියෙක් ජර්නලයට පැවසීය. එක්සත් ජනපද-තලිබාන් සාකච්ඡා පිලිබඳ සැලසුම් පිටතට කාන්දු වීමට සැලැස්වීමෙන්, න්‍යායවාදීන්ට මෙන්ම විදේශයන්හි, විශේෂයෙන් පකිස්ථාන හා ඇෆ්ගන් නිරීක්ෂකයන්ට සංඥා කෙරෙන්නේ වොෂින්ටනය තවදුරටත් තමන් මත එවන් සීමාවන් පනවා නොගන්නා බවය.

ජෙනරාල් ඩේවිඩ් පෙට්‍රවුස් වෙත ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද හමුදාවල අධිකාරය පවරමින් හා ඔහු ප්‍රධාන මධ්‍යම ආඥාපති ලෙස උසස් කිරීමෙන් ද, එලඹෙන ජනාධිපතිවරනයත් සමග එක්සත් ජනපද අධිරාජ්‍යවාදී පාලකයන්ගේ වෙනස් වීමෙන් ද, ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' එක්තරා මානයක් සහිතව කරගෙන යාමට එක්සත් ජනපද ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවස්ථාවක් සැලසෙයි.

මෙහිදී පෙට්රවුස්ගේ ඉතිහාසය විශේෂ වැදගත්කමක් උසුලයි. ඉරාකයේ එක්සත් ජනපද හමුදා ආඥාපති ලෙස ඔහු.''තල්ලුව'' මෙහෙයුම බාරව සිටි අතර දැන් අෆ්ගනිස්ථානයට යවා ඇත්තේ එහි අනුකරනය සඳහාය.

ඉරාකයේදී ඔහු ඇන්බාර් පලාතේ සුන්නි ගෝත්‍රිකයන් ද, විශාල නගරවල සුන්නි සටන් කරුවන් හා මාදි හමුදාවේ කොටසක් ද ඇතුලු දේශීය කුලී හමුදාවන් සල්ලි වලට නමා ගත්තේය. පසුව ඉරාකය පුරාම ''තල්ලුව'' යටතේ යොදවන ලද ඇමරිකානු හමුදාව විසින් ඔහු සමඟ ගැලතීම ප්‍රතික්ෂේප කලවුන් සමූලඝාතනය කරනු ලැබිනි. අන්බාර් පලාත, බකුබා, බැග්ඩෑඩ් හා බස්රා වල එසේ සිදු විය. අප්‍රකාශිත දහස් ගනන් ඉරාකීයන් ද සිය ගනන් ඇමරිකානු හමුදා භටයන් ද මිය යාමෙන් පසුව එක්සත් ජනපද හමුදාවන්ට පලවූ ඉරාක ප්‍රතිරෝධය අඩුවී ගියේය. එක්සත් ජනපද මාධ්‍ය හා දේශපාලන කවයන් තල්ලුව දැවැන්ත සාර්ථකත්වයක් ලෙස හුවා දැක්වූහ.

දැන් තල්ලුව ඇෆ්ගනිස්ථානයට ලඟාවී ඇත. අඩුම තරමින් 12000 කට වැඩි එක්සත් ජනපද හමුදා භටයන් ලඟදීම එරටට ගොඩ බසිනු ඇත. තලිබාන්වරු සමඟ එක්සත් ජනපදයේ සාකච්ඡා සඳහා පෙට්රවුස් ප්‍රසිද්ධියේම අනුමැතිය පලකොට ඇති බව ජර්නලය සඳහන් කරයි. හෙරිටේජ් පදනම නමැති බුද්ධි ආයතනයේදී ඇෆ්ගන් පිලිවෙත සම්බන්ධයෙන් ඔක්තෝබ්ර 8 වන දින කල කථාවක් තුල ඔහු මෙසේ සඳහන් කලේය. ''ඔබ සතුරන් සමඟ කථා කල යුතුය. ඔවුන්ගෙන් පුලුවන් කරම් සංඛ්‍යාවක් සමඟ සන්ධනගත වීමට ඔබ උත්සාහ කල යුතු වන අතර එවිට දැඩි මතධාරීන් කවුරුන්දැයි හඳුනාගත හැකිය.''

ඇෆ්ගන් ගෝත්‍රික නායකයන් ප්‍රවේශමෙන් තෝරා බේරාගැනීමේ ප්‍රතිපත්තිය පෙට්රවුස් ක්‍රමානුකූලව නිරීක්ෂනය කර ඔවුන් එකිනෙකාට ප්‍රතික්ෂේප කල නොහැකි යමක් පිලිගන්වනු ඇත. එක්සත් ජනපද මිලිටරි පිලිවෙත සමඟ පෙලගැසෙන සන්නද්ධ කන්ඩායම් වල නායකයන්ට සුදුසු සන්තොසම් ලැබෙනු ඇත. ''දැඩි මතධාරීන්ට'' ගුවන් ප්‍රහාර හා විශේෂ ආක්‍රමනික ක්‍රියාන්විතයන්ට මුහුන දීමට සිදුවෙයි.

දැන් ජය ගනු ඇතැයි විශ්වාස කරන ඩිමොක්‍රටික් පක්ෂයේ අපේක්ෂක බරක් ඔබාමා, කලක පටන්ම ඇෆ්ගනිස්ථාන යුද්ධයෙන් දුරස්ත වීම පිලිබඳව බුෂ් පරිපාලනය විවේචනය කල අතර පකිස්ථාන ඉලක්ක වෙත පහර දෙන ලෙස ඉල්ලා සිටීමේ තතු තුල ප්‍රතිපත්ති මාරුව විශේෂයෙන්ම වැදගත් වේ.

''ලබන මාසයේ ඡන්දයෙන් දිනන්නේ කවුරුන් ද යන්න නොසලකා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟීම සහතික කිරීමට'' සහාය දැක්වීම සඳහා ඔබාමා මෙන්ම රිපබ්ලිකානු ජෝන් මැකේන් යන ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනාම සිය එකඟතාව පල කර ඇති බව ජර්නලය සඳහන් කලේය.

2008 එක්සත් ජනපද මැතිවරනයේ ප්‍රමුඛ යථාර්තයක් මේ මඟින් සලකුනු කෙරේ. පෙනෙන පරිදි ඔබාමාගේ ජයග්‍රහනයත් සමඟ වඩාත් උපායශීලී එහෙත් සාහසිකත්වයෙන් නොඅඩු එක්සත් ජනපද පාලක පන්තියේ නියෝජිතයන් බලයට පත්වනු ඇත.

**ඇලෙක්ස් ලැන්ටියර්**

..

.

.

.

.

.

© www.wsws.org